දිවයින

2003 අගෝස්තු මස 22 වැනිදා සිකුරාදා

වෙළෙඳ

පිටුව 6.

# ලෝකය පුරා තොරතුරු තාක්ෂණය දුන් ජෙනෝවේට් දැන් ශ්‍රී ලංකාවේ

ටී. චන්ද්‍රසේකර

ශ්‍රී ලංකා ජෙනෝවේට් ආයතනය මගින් ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණය දියුණු කිරීමට පූර්ණ වශයෙන් කටයුතු කරන බව එම ආයතනයේ නිර්මාතෘ හා ප්‍රධාන විධායක නිලධාරි ජේ. ඇන්ටන් රවීන්ද්‍රන් මහතා පැවසීය.

හෙතෙම මේ බැව් සඳහන් කළේ ජෙනෙරුවේට් සමාගම ශ්‍රී ලංකාවේ පිහිටුවීමේ වැඩසටහනක් කොළඹ තාජ් සමුද්‍රා හෝටලයේදී පැවැති අවස්ථාවේය.

මෙම උත්සවය පාරිභෝගික කටයුතු ඇමැති රවි කරුණානායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙහිදී තවදුරටත් කථා කළ රවීන්ද්‍රන් මහතා මෙසේද කීහ.

මේ රටේ තොරතුරු තාක්ෂණය දියුණු කිරීමට ජෙනෝවේට් ශ්‍රී ලංකා සමාගම සම්පූර්ණයෙන්ම බැඳී සිටින බවත් ඉදිරි මාස 12 ක් තුළ මෙම සේවාව තවත් නගර තුනකට ව්‍යාප්ත කරන බවත් සඳහන් කළේය.

ජෙනෝවේට් සිංගප්පූර් නමැති ලෝකයේ රටවල් රැසක ක්‍රියාත්මක වන මෙම තොරතුරු තාක්ෂණ ආයතනය ශ්‍රී ලංකාවටද හඳුන්වාදීම විශාල ජයග්‍රහණයක් බවත් රවීන්ද්‍රන් මහතා පෙන්වා දුන්නේය.

2003 වර්ෂයේ මුල් කාර්තුවේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය සියයට 5.5 ක වර්ධන වේගයක් දක්නට ලැබුනු අතර එම තත්ත්වය තවදුරටත් පවත්වාගෙන යාමට තොරතුරු තාක්ෂණ දැනුම තවදුරටත් ව්‍යාප්ත කළ යුතුව ඇතැයිද හෙතෙම සඳහන් කළේය.

මෙම ආයතනය හරහා තොරතුරු තාක්ෂණය හදාරණ අයට ඩිප්ලෝමා සහතිකපත් ප්‍රදානය කරන අතර මෙම ආයතනයේ පාඨමාලාවන් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල හා සම්බන්ධීකරණයෙන් පවත්වාගෙන යනු ලබයි.



සයිබර්සොෆ්ට් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි ගෝවින්සි නාගරාස මහතා හා ජෙනෝවේට් ප්‍රධාන විධායක නිලධාරි ජේ. ඇන්ටන් රවීන්ද්‍රන් මහතා ආයතන දෙක අතර ගිවිසුමකට අත්සන් කළ අයුරු.

පින්තූරය - ප්‍රදීප් නිශාන්ත හේරත්

ජෙනෝවේට් ආයතනය කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය, ලන්ඩන් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියානු විශ්ව විද්‍යාලය සමඟ සම්බන්ධීකරණයෙන් පවත්වාගෙන යනු ඇත.

මෙම ආයතනය 1997 සිංහගප්පූරුවේදී ආරම්භ කළ අතර එය ඕස්ට්‍රේලියාව, මලයාසියාව, කොරියාව, ඉන්දුනීයාව ඉන්දියාව වැනි රටවල් තුළ ව්‍යාප්ත කර එහි අලුත්ම ශාඛාව ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබේ.

Scanned by CamScanner